2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (**Recovery Plan for Learning Loss - 2022**)

- 7 ශ්‍රේණිය

(7 ශ්‍රේණියේ දෙවන වාරයේ කාලච්ඡේද 18 ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම්

ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 07 ශ්‍රේණිය දෙවන වාරය සඳහා තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| 3.0 බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි | 7.3.2 ආජීව අෂ්ටමක සීලය පාදකකොට ගෙන තම ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කර ගනියි. | • ආජීව අෂ්ටමක සීලය පංචසීල ප්‍රතිපත්තියෙන් වෙනස් වන ආකාරය ප්‍රකාශකරයි.<br>• ආජීව අෂ්ටමක සීලය ආධ්‍යාත්මික සංවර්ධනයට වඩාත් හේතු කාරක වන බව පිළිගනියි.<br>• ආජීව අෂ්ටමක සීලය තාලානුරූපීව සජ්ඣායනා කර අදහස් දක්වයි.<br>• යහපත් සමාජ සම්මතයන්ට ගරු කරයි.<br>• නිවැරදි දිවිපැවැත්මකට හුරුවෙයි | සීලය පිළිබඳ සරල හැඳින්වීමක් | | 9 ආජීව අෂ්ටමක ශීලයෙන් දිවි සරුකර ගනිමු. | 03 |
| 3.0 බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | 7.3.3 බෞද්ධ සමාජ ධර්මවලට අනුගත වෙමින් ගුරු සිසු සබඳතා ගොඩනගා ගනියි. | • සිගාලෝවාද සූත්‍රයේ ගුරු ශිෂ්‍ය යුතුකම් පැහැදිලි කරයි.<br>• ගුරු භවතුන්ගේ ගුණ හැඳින ගෞරවයෙන් කටයුතු කළ යුතු බැව් පෙන්වා දෙයි.<br>• ගුරු ගෞරවයෙන් යුතුව කටයුතු කිරීමේ වැදගත්කම යන මැයෙන් කතාවකට උචිත සැලසුම සකස් කරයි. | ගුරුවරුන්ගේ ගුණ හැඳින ගුරු ගෞරවය රැකෙන පරිදි කටයුතු කරන අයුරු විස්තර කිරීම | | 10 ගුරු සිත සනසවා අකුරු උගනිමු සොඳවා | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගත ය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • තම යුතුකම් මැනවින් ඉට කරයි.<br>• ගුරු ගෞරයෙන් යුතුව කතා කරයි. | (සිගාලෝවාද සූත්‍රය) | | | |
| 4.0 සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි | 7.4.1 නායකයකුගේ වගකීම හා වගවීම තේරුම් ගෙන ඒ අනුව තම පෞරුෂය ගොඩනගා ගනියි. | • නායකයකුගේ වගකීම හා වගවීම පැහැදිලි කරයි.<br>• තම පෞරුෂය ගොඩනගා ගැනීමට වගකීම හා වගවීම හේතු වන බව පිළිගනියි.<br>• නායකත්ව ලක්ෂණ ලැයිස්තු ගත කරයි.<br>• නායකත්වයට ගරු කරයි.<br>• නායකයකු ලෙස කටයුතු කරයි. | නායකත්ව ලක්ෂණ අපණ්ණක ජාතක කතාව | | 11 ආදර්ශවත් නායකත්වය | 03 |
| 4.0 සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි | 7.4.2 ඉවසීමෙන් යුතුව ලෝක ස්වභාවයට මුහුණ දෙයි. | • ඉවසීමේ ගුණාංග පැහැදිලි කරයි.<br>• අවස්ථානුකූල ව ඉවසීම ප්‍රගුණ කළ යුතු බව පෙන්වා දෙයි.<br>• ඉවසීමේ ආනිශංස හා නොඉවසීමේ ආදීනව ලැයිස්තු ගත කරයි.<br>• අන් මත පිළිබඳව සැලකිලිමත් වෙයි.<br>• ඉවසීමෙන් කටයුතු කරයි. | ඉවසීම (ඉවසන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග, ඉවසීම ප්‍රගුණ කළ යුතු අවස්ථා, නොඉවසීමෙන් ලැබෙන අයහපත් ප්‍රතිඵල, ඉවසමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල) | | 12 සැනසුම ගෙන එන ඉවසීම | 03 |
| 5.0 ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් | 7.5.1 බුදු දහම ඇසුරින් පෝෂණය | • බුදු දහමින් පෝෂණය වූ ශ්‍රී ලාංකික ජන සමාජයේ සුවිශේෂ ලක්ෂණ නම් කරයි. | ▪ බුදු දහම ඇසුරින් පෝෂණය වූ ශ්‍රී ලාංකික | | 13 හෙළ බොදු සිරිතට යොමු වෙමු | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි. | වූ ශ්‍රී ලාංකික සමාජධර්ම රැක ගැනීමට ක්‍රියා කරයි. | • බුදු දහමින් පෝෂිතව සංස්කෘතික ලක්ෂණ ජාතික ප්‍රෞඪත්වයට හේතු වන බව පිළිගනියි.<br>• ශ්‍රී ලාංකික ජන සමාජයේ සුවිශේෂ ලක්ෂණ කීපයක් නිරූපණය කරයි.<br>• පාසල් සංස්කෘතියේ සුවිශේෂ ලක්ෂණයන්ට අනුගතව ක්‍රියා කරයි.<br>• ජන සංස්කෘතියේ සුවිශේෂ ලක්ෂණයන්ට ගරු කරමින් සුරක්ෂිත කරයි. | ජන සංස්කෘතියේ සුවිශේෂ ලක්ෂණ යටතේ කළගුණ සැලකීම, ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම, අග්‍රශෂ්‍ය දානය, භික්ෂු නායකත්වය පිළිගැනීම. | | | |
| 6.0 බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | 7.6.1 ජීවිතය හා සම්බන්ධ සියල්ලම සිදු වන්නේ පූර්ව කර්මයෙන් නො වන බව පිළිගෙන කටයුතු කරයි. | • නියාම ධර්ම පැහැදිලි කරයි.<br>• ජීවිතය හා සම්බන්ධ සියල්ලම පූර්ව කර්මයෙන් සිදු නො වන බව පිළිගනියි.<br>• නියාම ධර්මයන් සඳහා කාලීන නිදසුන් දත්ත ලේඛනයක් සකස් කරයි.<br>• කර්ම වාදයෙන් මිදී අධ්‍යාපනයේ යෙදේ<br>• සියල්ල පෙර කර්මයෙන් සිදු නො වන බව දැන කටයුතු කරයි | නියාම ධර්ම | | 15 සියල්ල කර්මයෙන් සිදු නොවේ | 03 |
| එකතුව | | | | | | **18** |